# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2072/54 – 2018 මැයි 25 වැනි සිකුරාදා – 2018.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**හෝටල් සහ භෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට හෝටල් සහ භෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2018 ජුනි මස 18 දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද ඊට අඩංගු විය යුතු ය.

ඒ. විමලවීර,<br>
සභාපති,<br>
හෝටල් සහ භෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව.

2018 මැයි මස 18 වැනි දින,<br>
කොළඹ 05,<br>
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

හෝටල් සහ භෝජන සැපයීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව විසින් ඇති කරන ලදුව, වර්ෂ 1979 අප්‍රේල් මස 27 වැනි දින අංක 34 දරන *ගැසට්* පත්‍රයේ පළකරනු ලැබූ නිවේදනයේ සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2012 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1789/19 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දා වූ ද, තීරණ පහත සඳහන් පරිදි තවදුරටත් වෙනස් කළ යුතුය.

හෝටල් සහ භෝජන සැපයීමේ කර්මාන්තයෙහි නියුක්ත 1 වන කොටසේ සඳහන් විවිධ ශ්‍රේණි යටතේ දැක්වෙන කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදළ විය යුතු අවම මාසික වේතන ප්‍රමාණය 11 වන කොටස එම ශ්‍රේණියට අනුරූප සටහනෙහි දැක්වෙන ප්‍රමාණය විය යුතුය.

1 වන කොටස

**සේවකයන්ගේ පන්තිය**

*1 වන ශ්‍රේණිය*

ඇසිස්ටන් රූම් බෝයි, ක්ලෝක් රූම් ඇටෙන්ඩන්ට්, ක්ලෝක් රූම් නැනී, කම්කරු - නිදන කාමර ක්ලීනර්ස්, ලවුන්ජ් ලේබර්ස්, කසල ශෝධක (නිදන කාමර), කසල ශෝධක කම්කරු, ඔෆිස් බෝයි, කාර්යාල කම්කරු, කම්කරු-ගබඩා, සයිකල් ඔඩ්ලි, මුළුතැන්ගෙයි සහායක, පිඟන් සෝදන්නා, කම්කරු මුළුතැන්ගෙයි, පෝටර්, පැන්ට්‍රිබෝයි, උදව්කරු, ප්ලේට් රූම් බෝයි, ග්ලාස් රූම් බෝයි, සිල්වර් රූම් බෝයි, බාර් ලේබර්ස්, යුටිලිටි වර්කර්ස්, වතු කම්කරු/උදව්කරු, නුපුහුණු කම්කරු (නඩත්තු), මුළුතැන්ගෙයි පිරිසිදු කරන්නා.

*11 වන ශ්‍රේණිය*

රූම් බෝයි, හවුස්මන්, රූම් මේඩ්, ලිනන් රූම් ඇටෙන්ඩන්ට්, රූම් නැනී පියන්වරු, මැසෙන්ජර්, වැකර්වරු, බෙල්බෝයි, පේජ්බෝයි, , සෝපානකරු, ඩෝමන්, බැගේජ් ලිෆ්ට් ඔපරේටර්වරු, පාස් ලිෆ්ට් ඔපරේටර්, සහකාර වේටර්, සහකාර ස්ටුවර්ඩ්, බස්බෝයි, බාර්ටෙන්ඩර් සහකරු, සහකාර බාර්මන්, බිලියඩ් මාකර්, ලයිෆ් ගාඩ්, ලොන්ඩර් ඇසිස්ටන්,ගාඩිනර්, පූල් ඇටෙන්ඩන්ට්, අර්ධ පුහුණු කම්කරු(නඩත්තු).

*111 වන ශ්‍රේණිය*

සිම්ස්ට්‍රස් ටේලර්, සම්බාහකයෝ, ලිපිකරු 111 වන ශ්‍රේණිය, ගබඩා සහායක, රියැදුරුවරු, බාර් කැෂියර්, බිල් ලිපිකරු, සාමාන්‍ය ලිපිකරු, පෞද්ගලික ලිපිකරු, ස්නැක් බාර් අරක්කැමි, රසකැවිලි සාදන්නෝ, සහකාර අරක්කැමි, තර්ඩ් කිචන් කොමිස්, සහකාර බක්කරේ,පැන්ට්‍රිමන්, අරක්කැමි 111 වන ශ්‍රේණිය, ඇසිස්ටන් බෙල් කැප්ටන්, හෝල් පෝටර්, වේටර්, බාර්මන් ස්ටුවර්ඩ්, බාර් වේටර්, බාර් ස්ටුවර්ඩ්, සිකියුරිටි ගාඩ්, උද්‍යාන පාලක, පුහුණු (නඩත්තු), කම්කරු බාර්ටෙන්ඩර්.

*1v වන ශ්‍රේණිය*

හෙල්ත් ක්ලබ්, පිළිගැනීමේ නිලධාරි, ලිපිකරු 11 වන ශ්‍රේණිය, සහකාර ගබඩාකරු, ගබඩා ලිපිකරු, ඇසිස්ටන් නයිට් ඔඩිටර්, වයින් කීපර්, කාඩෙක්ස් ඇසිස්ටන්වරු, ගිණුම් ලිපිකරු, සහකාර පොත් තබන්නා, කොස්ට් ක්ලාක්, ක්‍රෙඩිට් ක්ලාක්, විකුණුම් ලෙජර් ලිපිකරු, වැටුප් ලිපිකරු, යතුරු ලියන්නා, මුදල් අදියරු, ජෙනරල් ඇසිස්ටන්, පෞද්ගලික සහායක, සහකාර ප්‍රධාන අරක්කැමි, සෙකන්ඩ් කිචන් කොමිස් බක්කරේ, අංශ ප්‍රධාන අරක්කැමි, 11 පන්තියේ අරක්කැමි, දුරකථන ක්‍රියාකරු, පිළිගැනීමේ නිලධාරි, බෙල් කැප්ටන්, ප්‍රධාන පෝටර්, රූම් සර්විස්, ඕඩර් ටේකර්, බට්ලර්වරු, හෙඩ් බාර්මන්, හෙඩ් බාර් කීපර්, හෙඩ් වේටර්, හෙඩ් ස්ටුවර්ඩ්, කැප්ටන් හොස්ටේට්, හෙඩ් පැන්ට්‍රිමන්, ටී මේකර්, සිකියුරිටි ලීඩර්, සීනියර් ලොන්ඩරි ඇසිස්ටන්ට්.

*v වන ශ්‍රේණිය*

ෆ්ලෝ සුපර්වයිසර්වරු, ලිනන්රූම් සුපර්වයිසර්වරු, හෙද, ඇසිස්ටන් හවුස් කීපර්, ලිපිකරු 1 ශ්‍රේණිය, ගබඩා භාරකරු, ප්‍රධාන ගිණුම් ලිපිකරු, සරප්, පොත් තබන්නා, නයිට් ඔඩිටර්, ආදායම් ගණන් පරීක්ෂක, ලඝු ලේඛක, ප්‍රධාන ලිපිකරු, ප්‍රධාන අයකැමි, ගණන් පරීක්ෂක, සහකාර මිලදී ගැනීමේ නිලධාරි, චීෆ් ටයිම් කීපර්, කිචන් ස්ටුවර්ඩ් සුපර්වයිසර්, ෆස්ට් කිචන් කොමිස්, ප්‍රධාන අරක්කැමි, මණ්ඩලීය අරක්කැමි, රෙස්ටුරන්ට් අරක්කැමි, ෆ්‍රන්ට් ඔෆිස් ක්ලාක්, ගුවන් තොටුපල නියෝජිත, ප්‍රධාන පිළිගැනීමේ නිලධාරි, ප්‍රධාන ටෙලෙක්ස් ක්‍රියාකරු, ප්‍රධාන දුරකථන ක්‍රියාකරු, රිසවේෂන් ක්ලාක්, පරිපාලක ඩිස්ක්ජෝකි, කළමණාකරු, සිකියුරිටි ෆස්ට් ලීඩර්, උද්‍යාන පරිපාලක, ඉංජිනේරු චාර්ජ් හැන්ඩ්, පිහිනුම් තටාක පරිපාලක.

*II වන කොටස*

*වැඩ කරන මාසයක් සඳහා වූ අවම වේතන ප්‍රමාණ*

*සේවක පන්තිය*

| *සේවා වසර* | *ශ්‍රේණිය 1*<br>*රු. ශත* | *ශ්‍රේණිය 11*<br>*රු. ශත* | *ශ්‍රේණිය 111*<br>*රු. ශත* | *ශ්‍රේණිය 1v*<br>*රු. ශත* | *ශ්‍රේණිය v*<br>*රු. ශත* |
|---|---|---|---|---|---|
| 1 වසර | 10,000.00 | 10,420.00 | 10,840.00 | 11,260.00 | 11,680.00 |
| 2 වසර | 10,100.00 | 10,545.00 | 10,990.00 | 11,435.00 | 11,880.00 |
| 3 වසර | 10,200.00 | 10,670.00 | 11,140.00 | 11,610.00 | 12,080.00 |
| 4 වසර | 10,300.00 | 10,795.00 | 11,290.00 | 11,785.00 | 12,280.00 |
| 5 වසර | 10,400.00 | 10,920.00 | 11,440.00 | 11,960.00 | 12,480.00 |
| 6 වසර | 10,500.00 | 11,045.00 | 11,590.00 | 12,135.00 | 12,680.00 |
| 7 වසර | 10,600.00 | 11,170.00 | 11,740.00 | 12,310.00 | 12,880.00 |
| 8 වසර | 10,700.00 | 11,295.00 | 11,890.00 | 12,485.00 | 13,080.00 |
| 9 වසර | 10,800.00 | 11,420.00 | 12,040.00 | 12,660.00 | 13,280.00 |
| 10 වසර | 10,900.00 | 11,545.00 | 12,190.00 | 12,835.00 | 13,480.00 |

06 – 506

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.